**පස්ගොඩ ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**-----------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 31 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) කර්මාන්ත දෙකකට අදාළව ගෙවිය යුතු මුදල වූ රු.132,788 ක් වැඩියෙන් හා කර්මාන්ත 04 කට අදාළ ගෙවිය යුතු මුදල වූ රු. 114,744 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු. 56,804 ක මුදල සඳහා ප්‍රතිපාදන ඇතිකර නොතිබුණි.

(ඇ) ලැබිය යුතු රු.1,975,375 ක්වූ එක්වන් මුදල් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

### 1.3.2 නොසැසඳුණු ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 05 ට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛන අනුව දැක්වෙන ශේෂ අතර එකතුව රු.2,109,387 ක අසමානතා පවතින බව නිරීක්ෂණය විය.

### 1.3.3 ලැබිය යුතු ගිණුම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.321,348 ක් වූ හිග පොළ බදු ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්ම වූ එකතුව රු.136,862 ක ශේෂ 04 ක් ඇතුළත් වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.6,310,069 ක් වූ හිග එක්වන් මුදල් ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්ම වූ එකතුව රු.5,663,631 ක ශේෂ 04 ක් ඇතුළත් වී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.4,243,923 ක් වූ හිග කඩ කාමර කුලී ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්ම වූ එකතුව රු.2,009,165 ක ශේෂ 27ක් ඇතුළත් වී තිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොවීම නිසා එකතුව රු.3,036,877ක්වූ ගිණුම් විෂයයන් 07ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.5 අනුකූල නොවීම්**

**1.3.5.1 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති . | |
| (i) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමඟ වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) රීති 218 | සෑම වර්ෂයක් අවසානයටම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණය සිදු කල යුතු වුවද 2016 හා 2017 වර්ෂය සඳහා සභාවට අයත් සියළු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 571 | වර්ෂ 02 ක කාලයක් ඉක්ම වූ එකතුව රු.655,460 ක් වූ ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු හා විවිධ තැන්පතු ශේෂ 56 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2016 දෙසැම්බර් 31 දිනැති දපස/සං/01/01/53 දරන උපදෙස් ලිපිය. | සභාව විසින් ඉටුකල රු.2,488,034 ක් වටිනා කර්මාන්ත 02 ක් පිළිබඳව උපදෙස් ලිපියට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2015 ඔක්තෝබර් 09 දිනැති අංක 12/2015 දරන උපදෙස් ලිපිය. | 2016 වසරේ සිට නොමිලේ බෙදාදීම සඳහා දින දර්ශන හා දිනපොත් මුද්‍රණය කිරීම සිදු නොකල යුතු බව දක්වා තිබුණද ඊට අනුකූල නොවන අයුරින් රු.39,000 ක් වැය කර දිනපොත් මුද්‍රණය කර තිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,039,152 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,188,452 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

----------------------

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2017** | | | | **2016** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,460,000 | 1,414,011 | 1,409,801 | 97,397 | 1,465,000 | 1,530,787 | 1,535,255 | 93,187 |
| කුලී | 7,571,240 | 7,717,160 | 6,500,988 | 4,565,271 | 6,488,400 | 7,518,450 | 6,566,874 | 3,349,099 |
| බලපත්‍ර ගාස්තු | 661,200 | 328,892 | 328,892 | - | 326,600 | 471,774 | 471,774 | - |
| වෙනත් ආදායම් | 7,921,200 | 11,569,091 | 8,648,920 | 16,164,442 | 8,894,000 | 10,711,220 | 4,444,863 | 13,244,271 |
| -එකතුව- | 17,613,640 | 21,029,154 | 16,888,601 | 20,827,110 | 17,174,000 | 20,232,231 | 13,018,766 | 16,686,557 |

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

-------------------------------------

සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත කළ මුළු ආදායම රු. 17,613,640 ක් වූ අතර බිල් කළ ආදායම රු.21,029,154 ක් විය. රු.16,686,557 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුළු මුදල රු. 37,715,711 ක් වුවද, වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු.16,888,601 ක් වීමෙන් වර්ෂය අවසානයට මුළු හිඟය රු.20,827,110 ක් වී තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

------------------

**අක්කර බදු**

-----------

ආරම්භක හිඟ ශේෂය රු.93,187 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.24,670 ක් සමග සමාලෝචිත වර්ෂයට අයවිය යුතු මුළු මුදල රු.117,857 ක් විය. මුළු අයවීම් රු.21,781 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.96,076 ක් හිඟව පැවතුණි.

**2.2.4 කුලී**

-----

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

**(අ) පොළ බදු**

----------

වර්ෂය ආරම්භයට වූ රු.143,532 ක හිඟයට වර්ෂයේ බිල් කිරීම් රු.5,825,071 ක් සමග රු. 5,968,603 ක මුදලක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.5,647,255 ක් වූයෙන් වර්ෂය අවසානයට රු.321,348 ක් හිඟව පැවතුණි.

**(ආ) කඩකාමර කුලී**

----------------

(i) ආරම්භක හිඟ ශේෂය රු.3,199,195 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.1,567,650 ක් සමග වර්ෂය තුළ රු.4,766,845 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.519,457 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.4,247,388ක් හිඟව පැවතුණි.

(ii) වෙළඳ සංකීර්ණ 02 කට අයත් කඩ කාමර 35 ක අදාළ ගිවිසුම් 2014 වර්ෂයෙන් පසු අළුත් නොකිරීම නිසා රු.4,112,391 ක, මුදල් අය කරගැනීමේ අවිනිශ්චිතතාවයන් පැවතුණි. එමෙන්ම දපපා/ආ/5/6/පොදු අංක හා 2010 දෙසැම්බර් 27 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයට අදාළ නොවන අයුරින් කඩ කාමර 15 ක් අතුරු බදු දී තිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වූ උසාවි දඩ රු.2,063,488 ක් හා මුද්දර ගාස්තු රු.13,657,149 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිලිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම (output) ලබා නොගැනීම**

-------------------------------------------------------------

2016 වර්ෂය වෙනුවෙන් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ලැබී තිබූ රු. 30,000 ක මුදලට අදාළ කර්මාන්තය මෙතෙක් ඉටුකර නොතිබුණි.

**(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ (outcome) ලබා නොගැනීම**

-------------------------------------------------------

රු.2,017,248 ක මුදලක් වැයකර හීගොඩ වීනස් ක්‍රීඩාංගන ගොඩනැගිල්ලේ උඩු මහල ඉදිකර තිබූ අතර ඒ තුළ බාහිර හා අමතර වැඩ සඳහා රු.357,650 ක් වැයකර තිබුණද, වසර 04 ක් ගත වන තෙක් ගොඩනැගිල්ලේ මුදුන් වහල යොදා නොතිබූ අතර, විගණනයේදී දැනුම්දුන් පසු මුදුන් වහළ සකස් කලද, ඉදි කිරීම සිදුකල දින සිට ගොඩනැගිල්ල නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

-----------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

### 3.2 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

අනුමත සේවක සංඛ්‍යා සැලැස්මේ තෘතියික, ද්විතියික හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 07 ක පුරප්පාඩු හා තනතුරු 07 ක් වූ අතිරික්තයක් විය. සමාලෝචිත වර්ෂයේ සභාව විසින් බඳවාගෙන තිබුණු සේවකයෙකුට වැටුප් හා දීමනා ගෙවීම සඳහා සභා අරමුදලින් රු. 325,713 ක වියදම් කිරීමට සිදුවී තිබුණි.

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රා දේශීය සභා පනතේ 154(1) වගන්තිය පරිදි සභා බල ප්‍රදේශය තුළ විකුණනු ලබන ඉඩම්වල මුළු බිම් ප්‍රමාණය මත සියයට 1 ක බදු මුදලක් සභාවට අයවිය යුතු වුවද රු.28,545,200 ක විකුනුම් මිල මත අයවිය යුතු රු.285,452 ක මුදල අයකර ගෙන නොතිබුණි. තවද වෙන්දේසි කර තිබූ ඉඩම සංවර්ධනය කිරීමට පෙර සංවර්ධන බලපත්‍රය ලබාදීම හේතුවෙන් අයවිය යුතු සියයට 01 ක ආදායම ලබා ගැනීමට නොහැකි වි තිබුණි.

(ආ) භෞතික සැලසුම්, මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලිවල ඇස්තමේන්තුගත වියදම් රු.11,600,000 ක් වූ නමුත්, වර්ෂය තුළ ඉටුකළ වැඩවල පිරිවැය රු.3,274,170 ක් හෙවත් ඇස්තමේන්තු ගත අගයෙන් සියයට 28 ක් විය. තවද පොදු පරිපාලන වැඩසටහනෙහි ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 8.5 ක් පමණක් වියදම් දරා තිබුණි.

**3.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

---

ක්‍රීඩා පිටියක් තැනීම සඳහා සභාවට ලබාදී තිබූ අක්කර 01රූඩ් 02 පර්චස් 02 ක් වූ අමුහේන්ගොඩ ක්‍රීඩාපිටිය ඉඩමෙන්, රූඩ් 02 ක ප්‍රමාණයක් 2014 වර්ෂයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා වෘත්තීය පුහුණු අධිකාරියට ලබාදී තිබුණි. අදාළ ඉඩම දීර්ඝ කාලීන බදු ක්‍රමය යටතේ ලබාදීමට පෙර පැවති සභාව තීරණය කර තිබුණද, ඊට අනුකූලව බදු ගිවිසුමකට එළඹ බදු මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. අදාළ ඉඩම සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 16 ,18 හා 19(viii) වගන්තිවල කොන්දේසි ප්‍රකාරව කටයුතු කර නොමැති අතර, අදාළ අරමුනෙන් බැහැරව කටයුතු කර තිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

---

**නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

---

සභාව සතු ඉඩම් කැබලි 25 ක් ආරක්ෂා කිරීම සඳහා වැඩ පිළිවෙලක් යොදා නොතිබුණ අතර, ස්ථාවර වත්කම් ලේඛනයද නඩත්තු කර නොතිබුණි. 2014 වර්ෂයෙන් පසු ඉඩම් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. සභාවේ ගිණුම්ගත කර ඇති දේපල 25 න් අක්කර 03 පර්චස් 09 ක සහ අක්කර 02 රූඩ් 10 පර්චස් 09 ක ඉඩම් දෙකක් පමණක් සභා දේපළ ලෙස හඳුනාගෙන තිබුණි.

**3.6 හඳුනාගත් අලාභ**

---

2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ ඌරුබොක්ක සතිපොලේ බදු මුදල් අය කරන ගාස්තු ප්‍රතිශතය සියයට 16 සිට සියයට 30 දක්වා වැඩි කර තිබුණද 2016 වර්ෂයට සාපේක්ෂව එකතු කරන ලද බදු මුදල රු.38,250 කින් අඩු වී තිබුණි. මෙම බදු මුදල් අඩුවීම පිළිබඳව සභාව අවධානය යොමුකර නොතිබුණි. මාවරල සතිපොල බදු දීම මගින් 2017 වර්ෂයට අදාළව අයවිය යුතු රු.152,151 ක් වූ මුදල අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය තෙක් කටයුතු කර නොතිබුණි.

**3.7. ප්‍රසම්පාදනය**

---

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) හීගොඩ වීනස් ක්‍රීඩාංගනය අසල වෙළඳ සංකීර්ණයේ උඩු මහල ඉදි කිරීම කර්මාන්තය සඳහා රු.3,000,000ක මුදලකට ප්‍රාදේශීය සභාව විසින් කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම්ගතව තිබූ අතර, ඊට අදාළ මිල ගණන් කැඳවීම සඳහා පුවත්පත් දැන්වීමේ සිට කොන්ත්‍රාත්තුව පිරිනැමීම දක්වා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි. කොන්ත්‍රාත්කරු සමඟ එකඟ වී තිබූ රු.2,831,780 ක මුදලට වඩා රු.168,220 කින් වැඩි මුදලකට ගිවිසුම්ගත වී තිබුණි.

(ආ) බිසෝ ඇල්ල සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.3,673,195 ක ඇස්තමේන්තු සකස් කර රු.3,030,324 ක් වටිනා කර්මාන්තය කොටස් කර කර්මාන්ත 4 ක් එක් සමිතියකටද රු.642,871 වටිනා වැඩ කොටස් තවත් සමිතියකටද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.4 ඡේදයට අනුකූල නොවන පරිදි ලබා දී තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

### 4.1 අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) වැය විෂයයන් 08 ක ඉතිරිවීම්වල එකතුව රු.13,475,310 ක් වූ අතර, එම වටිනාකමින් සියයට 02 සිට සියයට 83 දක්වා පරාසයක පැවතුණි.

(ආ) ආදායම් විෂයන් 03 ක ළඟාකර නොගත් ඉලක්කයන්ගේ එකතුව රු.5,317,442 ක් වූ අතර, එම වටිනාකම සියයට 03 සිට සියයට 50 දක්වා පරාසයක පැවතුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

------------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. මුදල් රෙගුලාසි 134 පරිදි අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපති සමග සාකච්ඡා කර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු

-------------------------------------

2009 ජූනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්
(ආ) ආදායම් රැස්කිරීම
(ඇ) අයවැය පාලනය
(ඈ) කොන්ත්‍රාත් පාලනය
(ඉ) ගිණුම්කරණය